සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය | 2018 | 7 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | 2018 | தரம் 7 |
| **First Term Test** | **2018** | **Grade 7** |

| | |
|---|---|
| *නාට්‍ය හා රංග කලාව - I,II* | *පැය දෙකයි* |
| ***Drama and Theatre - I,II*** | ***Two Hour*** |

**නම/විභාග අංකය :- ..........................................................................................................**

- **1 සිට 5 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. රංග අභ්‍යාසවල යෙදීම අවශ්‍ය වන්නේ,
    1. නර්තන ශිල්පීන්ට යි.
    2. නළු නිළියන්ට යි.
    3. ප්‍රේක්ෂකයින්ට යි.
    4. නාට්‍ය අධ්‍යක්ෂවරයාට යි.

02. වේදිකා නාට්‍යක ලක්ෂණයක් නොවන්නේ,
    1. සජීවී බව
    2. සාමූහික කලාවකි.
    3. චිත්‍රාගාරය තුළ රූගත කිරීම.
    4. ප්‍රේක්ෂකයා උදෙසා නිර්මාණය කිරීම.

03. නාට්‍ය යේ තේමාව යනු,
    1. ඇතැම් කලා නිර්මාණවල දැකිය හැකි ය.
    2. නාට්‍යයේ නාට්‍යෝචිත ගුණය යි.
    3. කථා වස්තුවෙන් ප්‍රකාශ කරන අදහස ය.
    4. නාට්‍ය කෘතියේ ඇති විස්තරය යි.

04. සතර අභිනය ප්‍රයෝජනවත් වන්නේ,
    1. නළු නිළියන්ට යි.
    2. නාට්‍ය අධ්‍යක්ෂවරයාට යි.
    3. පෙළ රචකයාට ය.
    4. ආනුෂංගික ශිල්පීන්ට ය.

05. නූතන වේදිකාව මේ නමින් හැඳින්වේ,
    1. සබය.
    2. කමත.
    3. පින්තූර රාමු වේදිකාව.
    4. යාග භූමිය.

- **06 සිට 10 දක්වා ප්‍රශ්න වලට නොගැලපෙන පිළිතුර තෝරන්න.**

06. නාට්‍ය ගීත ගායනයේ දී සැලකිලිමත් විය යුතු කරුණකි.
    1. නිවැරදි වචන උච්චාරණය
    2. නිවැරදිව තනුව ගායනා කිරීම.
    3. ගායනයට උචිත පරිදි රංගනය.
    4. භාවිත කරන සංගීත භාණ්ඩවල ස්වභාව ය.

07. ජන ක්‍රීඩාවකි.
    1. එළුවන් කෑම.
    2. ලේන්සු හැංගීම.
    3. ඔළිද කෙළිය
    4. අත්පන්දු.

08. නාට්‍ය පිටපත් රචනයේ දී සැලකිලිමත් විය යුතුය.
    1. මුල මැද අග ගැළපීම.
    2. රංග විධාන තිබීම.
    3. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය.
    4. නළු වරණය.

09. සත්ව චරිත අනුකරණය කිරීමට පෙර,
    1. හැසිරීම් නිරීක්ෂණය කළ යුතු යි.
    2. හඬ හඳුනාගත යුතු යි.
    3. ගමන් විලාසය අනුකරණය කළ යුතු යි.
    4. වාසස්ථානය සොයා ගත යුතු යි.

10. ආනුෂංගික කලාවන්ට අයත් වේ.

1. පසුතල නිර්මාණ.
2. අංග රචනය.
3. පෙළ රචනය.
4. රංග වස්ත්‍රාභරණ.

- **11 සිට 15 දක්වා ප්‍රශ්න ඉදිරියේ නිවැරදි පිළිතුර සඳහා (√) ලකුණ ද වැරදි පිළිතුර සඳහා (x) ලකුණ ද යොදන්න.**

11. ඉතිහාස කතා නාට්‍ය බවට පත් කළ නොහැක. ( )
12. ශරීරයේ අංග සැහැල්ලු කිරීම ශීථිලකරණය යි. ( )
13. නාඩගම් රඟ දැක්වූයේ කරළිය නම් වේදිකාවේ ය. ( )
14. "පුංචි අපට දැන් තේරෙයි" නාට්‍ය, පාලිත ලොකුපෝතාගම මහතාගේ ය. ( )
15. "සිරි පැරකුම්" චිත්‍රපටය ඉතිහාස කතාවක් පසුබිම් කරගත් නිර්මාණයකි. ( )

- **16 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**

**( සුභ සහ යස, නරි බෑනා, වාචික, ප්‍රේක්ෂකයා, රංග ක්‍රීඩා)**

16. නාට්‍යක දෙබස් හා ගීත .............................................................. අභිනයට අයත් වේ.

17. නාට්‍යයක් නරඹන්නා ................................................ නම් වේ.

18. "ඇහැළ මලින් ගස් පිරිලා " ගීතය ........................................................ නාට්‍යයට අයත් වේ.

19. සාමූහික බව වර්ධනයට .............................................................. උදව් වේ.

20. ........................................................ ඓතිහාසික සිදු වීමක් ඇසුරෙන් කළ නාට්‍ය කි.

## නාට්‍ය හා රංග කලාව - II

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01. හුරුබුහුටි මේ පැටවුන්
අහංසකයො වාගෙ පෙනෙන
මගෙ පාළුවටත් එක්කල
ඉඳුම් හිටුම් දීම හොඳය
සැමදා ඉස්කෝලේ යන්ට
පොත පත පාඩම් කරන්න
ලියමු කියනු ඉගෙන ගන්න
හොඳ කීකරුවට හිඳින්න
කැමති ළමයි ඉන්නවනම්
කැමති මම ඉන්න දෙන්න
කැමති මම ඉන්න දෙන්න
කැමති මම කන්න දෙන්න

I. මෙම කොටස අයත් නාට්‍යයේ නම කුමක්ද? (ලකුණු 02)
II. නාට්‍ය රචනා කරන ලද්දේ කවුරුන් විසින්ද? (ලකුණු 02)
III. නාට්‍යයේ ප්‍රධාන චරිතය නම් කරන්න. (ලකුණු 02)

IV. මෙම නාට්‍යයේ තේමාව ලියන්න. (ලකුණු 02)

V. ඉහත කොටස කියන්නේ කවුරුන් විසින්ද? කාහටද? (ලකුණු 02)

02. i රංගභූමිය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii ඔබ දන්නා රංග භූමි තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii රංග භූමියක තිබිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

03. i ඔබ දන්නා රංග අභ්‍යාස දෙකක් ලියන්න. (ලකුණු 04)

ii රංග අභ්‍යාසවල නිරතවීමෙන් නළුවාට ලැබෙන වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 06)

04 i නාට්‍යක තේමාව යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii නාට්‍යයක් රචනා කිරීමට සුදුසු තේමාවන් තුනක් ලියන්න. (ලකුණු 06)

05. ඔබ දන්නා කතාවක් ඇසුරින් නාට්‍ය පෙළක් නිර්මාණය කරන්න. (ලකුණු 10)